Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

33 S I

Grade 11 – First Term Test – July 2023

කාලය : පැය 1
Time: 1 hour

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 11 ශ්‍රේණිය

# ඉතිහාසය – I

Name: - ...................................................................... Class: -................. Index no: - .......................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව රචනා වන කෘතිය කුමක්ද ?
(1) පූජාවලිය (2) රාජාවලිය (3) මහාවංශය (4) දීපවංශය

02. පහත සඳහන් මූලාශ්‍රය අතරින් ලන්දේසි මූලාශ්‍රයක් වන්නේ,
(1) බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තයයි.
(2) රිබෙයිරෝගේ ලංකා ඉතිහාසයයි.
(3) ෆර්නාඩ් ඩී. ක්වෙරෝස්ගේ ලංකාව පිළිබඳ මූලාශ්‍රයයි.
(4) රොබට් නොක්ස්ගේ එදා හෙළදිව ග්‍රන්ථයයි.

03. ඉතිහාසය ඉගෙනීමෙන් ලබන දැනුම භාවිත කළ යුතු ආකාරය වඩාත් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය මින් කුමක්ද ?
(1) අතීත ශ්‍රී විභූතිය පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම සඳහා.
(2) අතීතයේ කළ වැරදි නැවත සිදු නොවීමට වගබලා ගැනීම සඳහා.
(3) අතීතයේ ලත් ජයග්‍රහණ තවදුරටත් පවත්වා ගැනීම සඳහා.
(4) අතීතය තුළින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනගා ගැනීම සඳහා.

04. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් චීන, රෝම හා ඉන්දියානු කාසි ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමු වී ඇත. මෙයින් අනාවරණය වන වඩාත්ම වැදගත් කාරණය වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ දියුණු ආර්ථික රටාවක් පැවති බවය.
(2) ශ්‍රී ලංකාවේ කාසි භාවිතය ප්‍රචලිතව පැවති බවය.
(3) ලෝකයේ විවිධ රටවලින් සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නට ඇති බවය.
(4) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර දියුණු වෙළඳ සබඳතා පැවති බවය.

05. පනාකඩුව තඹ සන්නසෙන් පහත සඳහන් කුමන රජතුමාගේ තොරතුරු හෙළිවේද ?
(1) නිශ්ශංකමල්ල රජතුමා (2) I වන පරාක්‍රමබාහු රජතුමා
(3) I වන විජයබාහු රජතුමා (4) වසභ රජතුමා

06. ඉරණමඩු සැකැස්මට අයත් මැටි, වැලි සහ බොරලු සහිත පස් තට්ටුව බිහි වී ඇත්තේ කුමන යුගයේදී ද ?
(1) ප්ලයිස්ටොසීන යුගයේ අධික වර්ෂා සහිත කාලවලදීය.
(2) මහා හිම යුගයේදී ය.
(3) මුල් ඓතිහාසික යුගයේදී ය.
(4) හොලෝසීන යුගයේ කෙටි උණුසුම් කාලවලදී ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

07. වැව් ප්‍රපතනය හෙවත් එල්ලංගාව ලෙසට වැව් පද්ධතියක් ඉදිකිරීමෙන් පැරැන්නන් ලබා ගත් ප්‍රයෝජනය වන්නේ,
(1) ගංගා ජලය වැව්වලට පහසුවෙන් ලබා ගැනීම.
(2) ඇළ මාර්ග ඉදිකිරීමෙන් පහසුවෙන් ජලය බෙදා හැරීමට හැකි වීම.
(3) ජල සංරක්ෂණය කර ගනිමින් භූමියේ තෙතමනය රැක ගැනීම.
(4) වැව් ජලය ඵලදායී ලෙස කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීම.

08. ඓතිහාසික යුගය ආරම්භක අවධියේ සෙල්ලිපිවල සඳහන් වචන කිහිපයක් I තීරුවේත් එහි තේරුම II තීරුවේත් දැක්වේ. I තීරුව හා II තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. නකර | A. ගංගා හරස් කර බැඳි අමුණ. |
| 2. නියම්ගම් | B. වැටකින් ආරක්ෂා වූ ගම් |
| 3. පුරකමත | C. ගමත් පුරයත් අතර වූ ජනාවාසයකි. |
| 4. අවරණ | D. වෙළඳ ගම් |
| | E. නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා |

(1) C,D,E,A (2) A,E,D,C (3) A,B,D,A (4) C,E,D,B

09. ශ්‍රී ලංකාවේ පූර්ව රාජ්‍ය සමයේ නායකත්වයන් හැඳින්වූ ආකාරය පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
- පවුලක ප්‍රධානියා
- පවුල් කිහිපයක ප්‍රධානියා
- ගම් කිහිපයක ප්‍රධානියා

(1) ගමික, පරුමක, ගහපති (2) ගහපති, ගමික, පරුමක
(3) ගමික, ගහපති, පරුමක (4) පරුමක, ගහපති, ගමික

10. රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ,
(1) බලය විමධ්‍යගත වීමය. (2) බලය මධ්‍යගත වීමය.
(3) රාජධානි අතර ගැටුම් ඇතිවීමය. (4) රටවල් අතර ගැටුම් ඇතිවීමය.

11. ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයන් අසල්වාසී රටවල් සමග විවාහ සබඳතා ඇති කර ගැනීමෙන් අනාවරණය වන්නේ,
(1) අසල්වාසී රටවල පාලකයන් හා ලාංකික පාලකයන් අතර සුහදතාවය පැවති බවයි.
(2) ලාංකික රජවරුන්ගේ බල පරාක්‍රමය විදේශ රටවල ද ව්‍යාප්තව පැවති බවයි.
(3) විදේශ කුමාරිකාවන් සරණපාවා ගැනීම මෙරට රජවරුන්ගේ චාරිත්‍රයක්ව පැවති බවයි.
(4) ඥාති සබඳතා තුළින් දේශපාලන බලය ස්ථාවර කරගත් බවයි.

12. අතීතයේ දී විවිධ ජාතීන් අතුරෙන් වැඩි පිරිසක් මෙරටට පැමිණ ඇත්තේ,
(1) වෙළඳාම සඳහා ය. (2) අධ්‍යාපන කටයුතු සඳහා ය.
(3) සංචාරය සඳහා ය. (4) බලය අල්ලා ගැනීම සඳහා ය.

13. • මෙරට ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දීම.
• ප්‍රධාන මංමාවත්වල ගාවුත කණු සිටුවීම.

ඉහත සඳහන් කාර්යයවලට අදාළ වන රජවරු අනුපිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දුටුගැමුණු රජතුමා, වසභ රජතුමා
(2) දේවානම්පියතිස්ස රජතුමා, නිශ්ශංකමල්ල රජතුමා
(3) දුටුගැමුණු රජතුමා, නිශ්ශංකමල්ල රජතුමා
(4) දේවානම්පියතිස්ස රජතුමා, වළගම්බා රජතුමා



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

14. රටේ ජනතාව මහසෙන් රජු මින්නේරි දෙවියන් වශයෙන් හැඳින්වීමට හේතු වූයේ,
(1) විශාල විහාර කර්මාන්ත සිදු කිරීමයි.
(2) රටේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමයි.
(3) දේවාල සඳහා අනුග්‍රහය දැක්වීමයි.
(4) ආර්ථිකය නගාසිටුවීමට විශාල මෙහෙයක් කිරීමයි.

15. පහත "අ" හා "ආ" තීරු දෙක නිවැරදිව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. පේෂ කර්මාන්තය | A. මුතුගල්ල |
| 2. යකඩ කර්මාන්තය | B. මණ්ඩගල |
| 3. රන් කර්මාන්තය | C. වෙහෙරකෙම |
| 4. ඇත්දළ කර්මාන්තය | D. වේගිරිය |

(1) C,A,B,D (2) D,A,B,C (3) C,D,B,A (4) D,B,C,A

16. විවිධ භාෂාවලින් ලියවුණු ග්‍රන්ථ කිහිපයක් පහත දැක්වේ. ඒවායින් සිංහල භාෂාවෙන් ලියවුණු ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ජානකීහරණය, බාලාවබෝධය, අනුරුද්ධ ශතකය
(2) සියබස්ලකර, සසදාවත, මුවදෙව්දාවත
(3) දීපවංශය, අභිධානප්පදීපිකා, සාරත්ථදීපනී
(4) සියබස්ලකර, බාලාවබෝධය, දීපවංශය

17. අතීතයේ පීඩන ශල්කනය නම් ක්‍රමවේදය භාවිත කර ඇත්තේ,
(1) මැටි ගෙවල් තනා ගැනීමටය. (2) දඩයම් කිරීමටය.
(3) ගල් ආයුධ තනා ගැනීමටය. (4) යකඩ තනා ගැනීමටය.

- කෘතිමව සාදන ලද කඳු ගැටවලට වැව් බැම්ම සම්බන්ධ කර තිබීම.
- වැව් බැම්මේ දිග සැතපුම් හතක් පමණ වීම.
- අඩි හතලිස් හතරක් පමණ උස වැව් බැම්මක් තිබීම.
- අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටා තිබීම.

18. ඉහත තොරතුරු ගැලපෙනුයේ පහත සඳහන් කුමන වාරිකර්මාන්තය සඳහා ද ?
(1) යෝධ ඇළ (2) පරාක්‍රම සමුද්‍රය (3) කලා වැව (4) යෝධ වැව

❖ **පහත තොරතුරු ඇසුරෙන් 19 සහ 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
A. වැවේ අතිරික්ත ජලය පිටකිරීම.
B. විශාල ජල ධාරිතාවක් දරා සිටීම.
C. වැව් ජලය ප්‍රධාන ඇළට නිකුත් කිරීම.
D. ශක්තිමත්ව ඉදිකිරීම සඳහා පිහිටි ගලක් හෝ කඳු ගැට දෙකක් තෝරා ගැනීම.
E. වැවට එකතු වන රොන්මඩ ඉවත් කිරීම.

19. වැව් බැම්ම හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) B හා C (2) A හා B (3) B හා D (4) D හා E

20. සොරොව්ව සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) A හා E (2) B හා D (3) A හා C (4) C හා E

21. අතීත සමාජ සංවිධානය තුළ නිෂ්පාදනය භුක්තිවිඳි පුද්ගලයින් පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද ?
(1) වෙළෙන්දන්, ගොවියන්, ලෝකුරුවන්, කුඩීන්
(2) වෙළෙන්දන්, නාවික කප්පිත්තන්, වෛද්‍යවරු, ගුරුවරු
(3) නාවික කප්පිත්තන්, ගොවියන්, වෛද්‍යවරුන්, ධීවරයන්
(4) එඬේරුන්, [illegible]කරුවන්, ගුරුවරු, වෛද්‍යවරුන්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

22. මහාධිකරණයක් පිළිබඳ සඳහන් වන සිතුල්පව්ව සෙල්ලිපිය කරවන ලද්දේ කුමන රජු විසින් ද ?
(1) I වන සේන (2) I වන ගජබාහු (3) II වන සේන (4) IV වන ගජබාහු

23. අතීතයේ වෙළඳ ක්‍රම හා වෙළඳ නීති මහජනතාවට දැනුවත් කළ ප්‍රසිද්ධ සෙල්ලිපිය වන්නේ,
(1) බදුලු ටැම් ලිපිය යි. (2) මිහින්තලා සෙල්ලිපිය යි.
(3) ගොඩවාය සෙල්ලිපිය යි. (4) සිතුල්පව්ව සෙල්ලිපිය යි.

24. පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත්වීමට බලපෑ ප්‍රබලම සාධකය වූයේ,
(1) කුල සිරිත් ආරක්ෂා කරමින් ජීවත් වීමය.
(2) ස්වාමි භාර්යා ගෞරවය සුරකිමින් ජීවත් වීමය.
(3) මව්වරුන් ලෙස වගකීම් උසුලමින් කටයුතු කිරීමය.
(4) සූප ශාස්ත්‍රය පිළිබඳ දක්ෂතා දැක්වීමය.

25. පහත "අ" තීරුවේ දක්වා ඇත්තේ පරිසරය ආරක්ෂා කිරීමට අතීතයේ පැනවූ නීතියි. "ආ" තීරුවේ ඊට අදාළ රජවරු දැක්වේ. "අ" හා "ආ" තීරු නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. උස් ගොඩබිම්වල කැලෑ නොකැපිය යුතුය. | A. නිශ්ශංකමල්ල රජතුමා |
| 2. කැලෑවල ගස්කොලන් නොකැපිය යුතුය. | B. අමණ්ඩගාමිණී අභය රජතුමා |
| 3. ජලාශවල ජීවත් වන පක්ෂීන් නොමැරිය යුතුය. | C. V වන කාශ්‍යප රජතුමා |
| 4. නිසි කලට සී සෑම නොකරන අයට දඬ ගැසීම්. | D. IV වන මිහිඳු රජතුමා |
| | E. III වන උදය රජතුමා |

(1) D,E,A,C (2) A,B,D,E (3) B,C,D,E (4) B,A,C,D

26. කුරුණෑගල රාජ්‍ය සමයේ ජීවත් වූ පුද්ගලයෙකුට අසන්නට හෝ දකින්නට නොලැබෙන සිද්ධිය විය හැක්කේ මින් කුමක්ද ?
(1) චන්ද්‍රභානු නම් ජාවක රජ මෙරට ආක්‍රමණය කිරීම.
(2) නිශ්ශංක අලකේශ්වර විසින් කෝට්ටේ බලකොටුව ඉදිකිරීම.
(3) සද්ධර්මරත්නාවලිය වැනි ගද්‍ය ග්‍රන්ථ රචනා කිරීම.
(4) බෙලිගල දළදා මැදුරක් ඉදිකරවීම.

27. දැදිගම සෙල්ලිපියෙන් දැක්වෙන්නේ පහත සඳහන් කුමන තොරතුර පිළිබඳව ද ?
(1) පළමුවන පරාක්‍රමබාහු රජුගේ උපත පිළිබඳව.
(2) චෙංහෝ සෙනෙවියා ලංකාවට පැමිණීම පිළිබඳව.
(3) හයවන පරාක්‍රමබාහු රජුගේ උපත පිළිබඳව.
(4) සිංහල සංඝ මෙහෙය වූ කැරලි නායකයන්ට සමාව දීම පිළිබඳව.

28. මහනුවර රජකළ නායක්කර් වංශික පාලකයන් අනුගමනය කළ රාජ්‍ය උරුම සම්ප්‍රදාය වූයේ රජුගෙන් පසුව ඔහුගේ,
(1) පුතා රජවීමය. (2) වැඩිමහල් සොහොයුරා රජවීමය.
(3) බිසවගේ සොහොයුරා රජවීමය. (4) අගබිසව රජවීමය.

29. පහත සඳහන් සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළින් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
A. කුසුමාසන දේවි දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබීම.
B. සේනාසම්මත වික්‍රමබාහු රාජ්‍යත්වයට පත්වීම.
C. ස්පිල් බර්ජන් උඩරට රජු හමුවීමට පැමිණීම.
D. මෙරට සියම් නිකායේ ආරම්භය සිදුවීම.

(1) D,C,B,A (2) B,C,A,D (3) B,A,C,D (4) C,B,D,A

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

30. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් උඩරට හා පෘතුගීසීන් අතර වූ සබඳතා පිළිබඳව සත්‍ය ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

A. පෘතුගීසීහු උඩරට ආක්‍රමණය කර ජයග්‍රහණය කළහ.
B. පෘතුගීසීහු උඩරට ප්‍රදේශවල වෙළඳ ඒකාධිකාරය අත්කර ගත්හ.
C. උඩරට ප්‍රදේශවල පාලන බලයක් ලබා ගැනීමට පෘතුගීසීහු අසමත් වූහ.
D. පෘතුගීසීහු උඩරට රජවරුන් සමග ලන්දේසීන්ට වඩා මිත්‍රශීලී පිළිවෙතක් අනුගමනය කළහ.
E. උඩරට සමග පෘතුගීසි සබඳතාව ආක්‍රමණශීලී එකක් විය.

(1) A හා B  (2) B හා E  (3) C හා E  (4) C හා D

31. යුරෝපීය පුනරුද සමයේ දියුණුවට පත් වූ ක්ෂේත්‍ර කිහිපයක් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් "අ" තීරුවේ ද, ඔවුන් ප්‍රසිද්ධියට පත් ක්ෂේත්‍ර "ආ" තීරුවේ ද දැක්වේ. තීරු දෙක නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. ක්‍රිස්ටෝපර් කොලොම්බස් | A. රුධිර සංසරණ පද්ධතිය |
| 2. ගැලීලියෝ ගැලිලි | B. කැනඩාව |
| 3. විලියම් හාවේ | C. බටහිර ඉන්දීය දූපත් |
| 4. ජොහැන්ස් කෙප්ලර් | D. දුරදක්නය |
| | E. ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බවය. |

(1) C,D,A,E  (2) B,A,C,D  (3) B,D,C,B  (4) C,A,D,E

32. පහත දැක්වෙන කාර්මික ක්ෂේත්‍රයේ ප්‍රතිඵල අතුරෙන් ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දැක්වෙන පිළිතුර කුමක්ද ?

A. වෘත්තීය සංගම් හා වැඩ වර්ජන ඇතිවීම.
B. භාණ්ඩ නිෂ්පාදනය වේගවත් වීම.
C. යටත් විජිත ඇතිකරගැනීමේ තරගයක නිරත වීම.
D. මුඩුක්කු හා පැල්පත් ව්‍යාප්ත වීම.

• දී ඇති වගුව ඇසුරින් 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | පුද්ගල නාම | ආණ්ඩුකාරවරු |
|---|---|---|
| A. ක්‍රි.ව. 1803 | D. පුරන් අප්පු | G. ෆ්‍රෙඩ්රික් නෝර්ත් |
| B. ක්‍රි.ව. 1818 | E. මැක්ඩෝවල් | H. රොබට් බ්‍රවුන්රිග් |
| C. ක්‍රි.ව. 1848 | F. කැප්පෙටිපොළ දිසාව | J. ටොරින්ටන් සාමි |

33. ඉංග්‍රීසින්ගේ යුධ ශක්තිය පෙන්වා තමන්ට වාසිදායක ගිවිසුමකට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කැමති කරවා ගැනීමේ අරමුණට අදාළ වන තොරතුරු ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) B,F,G  (2) A,E,H  (3) C,D,J  (4) A,E,G

34. පළමුවන බ්‍රිතාන්‍ය විරෝධී අරගලය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

(1) B,F,H  (2) C,F,J  (3) B,E,H  (4) A,D,J

35. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා පුරෝගාමී වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග්  (2) විලියම් ග්‍රෙගරි, එඩ්වඩ් බාන්ස්
(3) එඩ්වඩ් බාන්ස්, හෙන්රි වෝඩ්  (4) තෝමස් මෙට්ලන්ඩ්, ස්ටුවර්ට් මැකන්සි



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
CamScanner

කර ගෙන කටයුතු කළ පුද්ගලයන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) වලිසිංහ හරිස්චන්ද්‍ර, ජෝන් ද සිල්වා, ඩී. බී. ජයතිලක
(2) අනගාරික ධර්මපාලතුමා, පියදාස සිරිසේන, ජෝන් ද සිල්වා
(3) අනගාරික ධර්මපාලතුමා, ඩී. බී. ජයතිලක, පියදාස සිරිසේන
(4) අමදෝරිස් මෙන්ඩිස්, ජෙරමියෙස් දියෙස්, ජෝන් ද සිල්වා

- යාපනය හින්දු විද්‍යාලය පිහිටුවීම.
- කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම.

37. ඉහත සඳහන් පාසල් ආරම්භ කිරීමට පුරෝගාමීව කටයුතු කළ පුද්ගලයන් පිළිවෙළින් සඳහන් ද තෝරන්න.
(1) පොන්නම්බලම් රාමනාදන් මහතා, ටී. බී. ජයා මහතා
(2) පොන්නම්බලම් අරුණාචලම් මහතා, සිද්ධි ලෙබ්බේ මහතා
(3) ආරුමුග නාවලර්තුමා, සිද්ධි ලෙබ්බේ මහතා
(4) ආරුමුග නාවලර්තුමා, ටී. බී. ජයා මහතා

- **පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 38, 39, 40 ප්‍රශ්නවලට පි සපයන්න.**

A. 1. නාවුක හෙන්රි
2. දේශ ගවේෂණය

B. 1. ශෂ්‍ය මාරු ක්‍රමය
2. ලෙඩරෝග ව්‍යාප්තිය

C. 1. කොන්ස්තන්තිනෝපලය
2. පුනරුදය ඇතිවීම.

D. 1. ජල රාමුව
2. යකඩ හා වානේ කර්මාන්තය

38. දෙවැන්න ක්‍රියාත්මක වීම සඳහා පළමුවැන්නේ අනුග්‍රහය පෙන්වන ප්‍රකාශ / පද යුගලය කුමක්ද
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න දෙවැන්න අවම කිරීමට හේතුවන ප්‍රකාශ / පද යුගලය කුමක්ද ?
(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොපෙන්වන ප්‍රකාශ / පද යුගලය කුමක්ද ?
(1) A (2) B (3) C (4) D



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CS CamScanner